සත්‍ය පිටපතක බව සහතික කරමි.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 627—1990 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා—1990.09.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස — පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙනවෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... ... | — | සභාතුරු - ඇමැර්තු ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... | 892 | බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... | — | තොටුපළ්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන භාරගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකටම පළකළ යුතු ගැසට් නිවේදනය භාර ගන්නා වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. සභාතුරු ඇමැර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව—එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩල යනාදීයෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනයට සති දෙකකට පෙර—එනම් 1990 සැප්තැම්බර් 14 වන දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යායුතු දැන්වීම්, 1990 අගෝස්තු 31 දින දහවල් 12 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

1990 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

801—B 078713—7,797 (90/08)

GP1485
[signature] 16-07-08



## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාත් සභාව

1989 අංක 01 දරණ සබරගමුව පළාත් සභා වැටුප් සහ දීමනා ප්‍රඥප්තිය

(සබරගමුව පළාත් සභාවේ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට වැටුප් ගෙවීම.)

(සභාගතය සම්මත කළේ 1989 ජූනි මස 08 වැනි දින.)

(අනුමැතිය ලැබුණේ 1989 ජූනි 30 වැනි දින.)

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදියි.

එම්. ඒ. කරුණාපාල,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව,
රත්නපුරය.

**පළාත් සභා (වැටුප් සහ දීමනා ගෙවීම) ප්‍රඥප්ති අංක 01—1959**

සබරගමුව පළාතේ පළාත් සභාවේ සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට වැටුප් හා දීමනා නියම කිරීම ලැබීමට අදාල ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය**

(1) ප්‍රඥප්තිය 1989 අංක 01 දරණ පළාත් සභා වැටුප් සහ දීමනා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

**සබරගමුව පළාත් සභාවේ සභාපති හා නියෝජ්‍ය සභාපතිට ගෙවනු ලබන වැටුප් හා දීමනා**

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින සහ ඉන් පසුව,

(අ) පළාත් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනා තත්කාලයෙහි පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනිකුත් දීමනා වලට සමානවද,

(ආ) පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාගේ මාසික වැටුප් සහ දීමනා තත්කාලයෙහි කැබිනට් මණ්ඩල අමාත්‍යවරයෙකුගේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන වැටුප් සහ අනිකුත් දීමනාවලින් සියයට පණහකට සමානවද ගෙවිය යුත්තේ ය.

**වැටුප් සහ දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.**

(3) මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවනු ලබන සභාපතිවරයාගේ හා නියෝජ්‍ය සභාපතිවරයාගේ වැටුප් සහ දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.

මෙම ප්‍රඥප්තිය 1989 ජූනි මස 08 වන දින පැවැත්වුනු සබරගමුව පළාත් සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව සහතික කරමි.

(රැස්වීමට පැමිණ සිටි සම්පූර්ණ මන්ත්‍රීන් සංඛ්‍යාව විසිහතකි.) (27)

ජේ මපාල දසනායක,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

1989. 06. 08.

1989 ජූනි මස 30 වන අද දින දකුණත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඳ(2) ව්‍යවස්ථාව යටතේ අනුමතය දෙමි.

නොයෙල් විමලසේන,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

9-38/1

---

### සබරගමුව පළාත් සභාව

1989 අංක 02 දරණ සබරගමුව පළාත් සභා වැටුප් සහ දීමනා ප්‍රඥප්තිය.

(රාජ්‍ය සේවා, කොමිෂන් සභාවේ සාමාජිකයන්ට වැටුප් ගෙවීම.)

(සභාගතය සම්මත කළේ 1089 ජූනි මස 08 වැනි දින.)

(අනුමැතිය ලැබුණේ 1080 ජූනි 30 වැනි දින.)

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදියි.

එම්. ඒ. කරුණාපාල,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව
රත්නපුරය.

**පළාත් සභා (වැටුප් සහ දීමනා, ගෙවීම) ප්‍රඥප්ති අංක 02—1989**

සබරගමුව පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්ට වැටුප් හා දීමනා නියම කිරීම ලැබීමට අදාළ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය**

01. ප්‍රඥප්තිය 1980 අංක 02 දරණ (පළාත් සභා වැටුප් සහ දීමනා) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

**සබරගමුව පළාත් සභාවේ රාජ්‍ය සේවා, කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා**

02. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සහ ඉන් පසුව,

(අ) සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් හාරදහසක් (රු. 4,000) ද,

(ආ) සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා, කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් තුන්දහසක් (රු. 3,000) ද, ගෙවිය යුත්තේ ය.

**වැටුප් සහ දීමනා ගෙවීම් සබරගමුව පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.**

03. මෙම ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයින්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා සබරගමුව පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේ ය.

මෙම ප්‍රඥප්තිය 1989 ජූනි මස 08 වන දින පැවැත්වුනු සබරගමුව පළාත් සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව සහතික කරමි.

(රැස්වීමට පැමිණ සිටි සම්පූර්ණ මන්ත්‍රීන් සංඛ්‍යාව විසිහතකි.) (27)

ජේ මපාල දසනායක,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

1989, 06. 08

1989 ජූනි මස 30 වන අද දින දකුණත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඳ(2) ව්‍යවස්ථාව යටතේ අනුමතය දෙමි.

නොයෙල් විමලසේන,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

9-38/2

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



## සබරගමුව පළාත් සභාව

1989 අංක 03 දරණ සබරගමුව පළාත් සභා හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය.

(සහතිකය සටහන් කළේ 1989 ජූලි මස 20 වැනි දින. අනුමැතිය ලැබුණේ 1989 ජූලි 26 වැනි දින.)

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදිය.

එම්. ඒ. කරුණාපාල,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව,
රත්නපුරය.

### සබරගමුව පළාතේ 1989 අංක 03 දරණ හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය

1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට සම්බන්ධ සහ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය**

1. මේ ප්‍රඥප්තිය 1989 අංක 03 හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

**පළාතේ හදිසි අවස්ථා අරමුදල**

2. (1) සබරගමුව පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් (මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.

(2) රුපියල් දස ලක්ෂ එකක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළ යුතු අතර එම මුදල අරමුදලේ කොටසක් විය යුතුයි.

(3) පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කෙරෙන සියළු මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

**අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20(2) වගන්තිය අනුව විය යුතුය.**

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20(2) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන, අනුගමනය කළ යුතුය.

**අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය**

4. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු අතින් සිදුවිය යුතුය.

මෙම ප්‍රඥප්තිය 1989 ජූලි මස 20 වන දින පැවැත්වූ සබරගමුව පළාත් සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සභා සම්මත වූ බව සහතික කරමි.

(රැස්වීමට පැමිණ සිටි සම්පූර්ණ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තිස් තුන යි)

ජේ. මහීපාල දසනායක,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

1989 ජූලි මස 26 වන අද දින 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඡ(2) වගන්තිය යටතේ අනුමතය දෙමි.

ඊ. හෑසෙල් විමලසේන,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

9-38/3